**උඩුබද්දාව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතු වටිනාකම රු.1,160,500 ක් වූ ජල බවුසර දෙකක් යන්ත්‍ර හා උපකරණ ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) රු.45,000 ක් වූ ජල ටැංකි දෙකක් හා රු.32,000 ක් වූ සෙල්ලම් උපකරණ ඉඩම් සහ ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) එකතු වටිනාකම රු.571,180 ක් වූ වත්කම් විෂයයන් 12 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සභාවට අයත් සුසාන භූමි 53 ක ඉඩම් වටිනාකම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) රාජ්‍ය කාර්යාලයකට පරිත්‍යාග ලෙස ලබාදී තිබුණු රු.180,000 ක් වූ ධූමායන යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**----------------------**

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 ක ශේෂයන් හා ඊට අදාළ උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු.8,575,443 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

(අ) ලැබියයුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබියයුතු ගිණුම් වටිනාකම රු.103,552,285 ක් වූ අතර, ඉන් රු.54,086,277 ක් වර්ෂයකට වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.30,064,433 ක් වූ අතර ඉන් රු.9,370,941 ක් වර්ෂයකට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.172,080,220 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) 154 (1) වගන්තිය | ඉඩම් කට්ටි කර විකිණීමේදී විකුණුම් මිළෙන් සියයට 01 ක් අයකරගෙන නොතිබුණු අතර, ඇස්තමේන්තුගත විකුණුම් මිළෙන් සියයට 01 ක් පමණක් අයකරගෙන තිබුණි. |
| (ii) 186 වගන්තිය | අක්කර 23 යි රූඩ් 02 යි පර්චස් 13.8 ක් වූ නිවාස දේපල සංවර්ධනය කිරීම් 06 කට අදාළව ඉඩම් කට්ටි සැලසුම් සඳහා සභා අනුමැතිය නොමැතිව සංවර්ධන කටයුතු කර අලෙවි කර තිබුණු අතර, ඊට එරෙහිව සභාව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති

| | | |
|---|---|---|
| (i) | 5 (6) රීතිය | නියමිත කාල සීමාව තුළදී ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු සියළු ආදායම් හා වෙනත් ගාස්තු එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) | 218 රීතිය | සභාවේ සියළු ඉඩම් හා ගොඩනැගිලි සභාව පිහිටුවීමේ දින සිට මේ දක්වා පරීක්ෂාවකට ලක් කර නොතිබුණි. |

(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය — වාහන දෙකක රු.510,065 ක් වූ අභ්‍යන්තර අළුත්වැඩියාවන් සිදුකිරීමේදී චක්‍රලේඛ උපදෙස් අභිබවා කටයුතු කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,295,405 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,387,478 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 3,391 | 4,481 | 3,888 | 1,800 | 2,193 | 3,908 | 3,035 | 1,472 |
| (ii) | බදු කුලී | 11,600 | 10,556 | 10,492 | 137 | 10,600 | 11,243 | 11,918 | 78 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 768 | 567 | 567 | - | 808 | 1,219 | 1,219 | - |
| (iv) | වෙනත් ආදායම් | 73,090 | 77,025 | 50,617 | 101,615 | 64,579 | 69,480 | 66,062 | 87,325 |
| එකතුව | | 88,849 | 92,629 | 65,564 | 103,552 | 78,180 | 85,850 | 82,234 | 88,875 |

සටහන

2017 වර්ෂයේ රැස්කළ ආදායම් තුළ පෙර වර්ෂවල රු.7,626,000 ක් වූ හිඟ අයකිරීම් ද ඇතුළත්ව තිබේ.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායම් සමඟ රුපියල් මිලියන 181 කින් රුපියල් මිලියන 65.5 ක් රැස්කර තිබුණි. එයින් රුපියල් මිලියන 7.6 ක් ඉකුත් වර්ෂයට අදාළ ලැබීම් විය. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රුපියල් මිලියන 88 ක් වූ ලැබිය යුතු ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 103 ක් දක්වා වැඩි වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු, අක්කර බදු හා ජල ගාස්තු ආදායම් රු.1,839,003 ක් අයකර ගැනීමට තිබුණි.

### 2.2.4 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවියයුතු කඩකුලී හා බදුකුලී රු.137,406 ක් වූ අතර 2011 වර්ෂයේ සිට අයවියයුතුව පවතින රු.22,511 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තු ලෙස රු.768,300 ක් ඇස්තමේන්තු කර තිබුණද, තත්‍ය ආදායම රු.566,995 ක් විය.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.6,284,741 ක් සහ මුද්දර ගාස්තු රු.68,667,268 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 වන විටත් කාරණා 16 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම
------------------------------------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කි.මී 1,000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2017 අනුව රු.6,000,000 කින් මාර්ග 06 ක් සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර 2017 මැයි වනවිට අනුමැතිය ලබාගෙන තිබුණද 2017 ඔක්තෝබර් වනවිටත් මාර්ග 04 ක සංවර්ධන කටයුතු ආරම්භ කර නොතිබුණු අතර මාර්ග 02 ක සංවර්ධන කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

(ii) ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2017 අනුව රු.8,948,357 කින් ප්‍රාදේශීය මාර්ග 05 ක සංවර්ධන කටයුතු 2017 නොවැම්බර් 15 දින හෝ ඊට ප්‍රථම නිම කළයුතු වුවත්, එම මාර්ග සංවර්ධන කටයුතු 2017 ඔක්තෝබර් 10 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------
නොදිරන කසළ අපහරණය කිරීමේදී බේල් මැෂිමක් යොදා ගැනීමට කටයුතු කර නොතිබූ අතර සාම්ප්‍රදායික ලෙස කකුලෙන් පාගමින් සේවක ශ්‍රමයෙන් එම කටයුත්ත සිදු කර තිබුණි. තවද එම නොදිරන කසළ ගබඩා කිරීම සඳහා කිසිදු ආවරණයක් ඉදිකර නොතිබුණි.

(ඈ) පාරිසරික ගැටළු
--------------------
2017 වර්ෂයේදී සභාවේ අනුමැතිය නොමැතිව ඉඩම් 06 ක අක්කර 23 රූඩ් 02 පර්චස් 13.8 ක් නිවාස දේපල ලෙස සංවර්ධනය කර තිබුණු අතර, එමගින් ඇතිවන පාරිසරික ගැටළු හා බලපෑම් පිළිබඳ ඇගයීමක් සභාව විසින් සිදුකර නොතිබුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක
----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) “තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030” පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණු බැවින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීම, ඊට අදාළ සැලසුම් සකස් කිරීම, ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම, උනන්දුවක් දක්වන පාර්ශව හඳුනා ගැනීම හා ඊට අදාළ මිනුම් දඬු හා දත්ත එක්රැස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කෙරෙහි අහිතකර ලෙස බලපාන නිවාස දේපල අවිධිමත් පරිදි සංවර්ධනය කිරීම් වැළැක්වීමට කටයුතු කර නොතිබුණි.

## 3.2 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැඩ පරිපාලක තනතුරු 02 ක් සඳහා බඳවා ගැනීමේදී ඉදිරිපත් කරන ලද සහතිකවල නිරවද්‍යතාව එම සහතික ප්‍රදානය කර තිබෙන ආයතන මගින් සනාථ කරගෙන නොතිබුණු අතර වැඩ පරිපාලක තනතුරට අදාළව සභාවේ බඳවා ගැනීම් පටිපාටිය හා ඊට අදාළ මූලික සුදුසුකම් පිළිබඳ තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් අනුව ස්ථිර තනතුරු ප්‍රදානය කිරීමේදී, බඳවා ගනු ලැබූ ආදේශ තනතුරට අදාළව ස්ථිර පත්වීම් ප්‍රදානය කළයුතු බව දක්වා තිබුණද, සෞඛ්‍ය කම්කරුවන් (ආදේශක) දෙදෙනෙකුට වැඩ පරිපාලක තනතුරුවල ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි.

(ඇ) පැරණි කාර්යාල සංකීර්ණයේ කම්කරුවන් 03 දෙනෙකුගේ වැඩ අධීක්ෂණයට යොදවා තිබුණු වැඩ පරිපාලකවරයා නිසි පරිදි වැඩ අධීක්ෂණය කර නොතිබුණි.

(ඈ) 2013 ජනවාරි 01 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තාව අනුව MN-01-2006/ඒ සනයේ වැඩ පරිපාලක තනතුර සඳහා පත්වීම් බලධාරියා වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වුවද සභාවේ රාජකාරී ආවරණය කරනු ලබන වැඩ පරිපාලක නිලධාරීන් දෙදෙනාට සභාව විසින් ස්ථිර පත්වීම් ප්‍රදානය කර තිබුණි.

## 3.3 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

--------------------------------

2016 වර්ෂයේදී සභාවේ නියමයකින් හා අනුදැනුමකින් තොරව මාර්ග 02 කට 2017 සැප්තැම්බර් මාසයේදී රු.2,217,000 ක වටිනාකමකට ඇස්තමේන්තු පිළියෙල කර සියයට 75 ක් වැඩ අවසන් කල බවට සාවද්‍ය තොරතුරු දක්වා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තුමේන්තුවට යොමුකර තිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

--------------------------

### 3.4.1 පවරා නොගත් වත්කම්

---------------------------

සභාව විසින් භාවිතා කරන වාහන 02 ක්, ක්‍රීඩාංගණයක් හා පොදු සුසාන භූමි 44 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4.2 නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් වෑන් රථයක් 2012, 2014 හා 2016 වර්ෂවල අවස්ථා 04 කදී රු.1,283,845 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණද, තවදුරටත් පවතින අඩුපාඩු හේතුවෙන් ධාවනය කළ හැකි තත්ත්වයේ නොතිබුණි. වාහනයේ ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික ලබාගෙන නොතිබුණු අතර, 2015 පෙබරවාරි 11 දින සිට වර්ෂ 03 කට ආසන්න කාලයක් ධාවනයෙන් ඉවත් කර වාහන අංගනයේ ගාල්කර තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 24 දින රු.504,878 ක් වැයකර කොල්ලුපිටිය වත්ත ළමා උද්‍යානය වෙනුවෙන් මිලදීගෙන තිබුණු ක්‍රීඩා උපකරණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සවි කිරීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි.

(ඇ) අඩි 8x4 ප්‍රමාණයේ ඇස්බැස්ටස් සීට් 45 ක් සහ වහල ඉදි කිරීමේදී භාවිතා කරනු ලබන කොන්ක්‍රීට් කණු වර්ෂ ගණනාවක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

### 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.6.2 සැපයුම් හා සේවා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අපේක්ෂිත භාවිතය සම්බන්ධ සැලැස්මක් නොමැතිව ගල් රෝලක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට පුවත්පත් 03 ක දැන්වීම් ප්‍රසිද්ධ කිරීම සඳහා රු.24,984 ක් 2017 ජූනි ගෙවා තිබුණද, එම මිලදී ගැනීම 2018 අප්‍රේල් වන විටද සිදුකර නොතිබුණි.

(ආ) කොල්ලුපිටිය වත්ත ළමා උද්‍යානයට ක්‍රීඩා උපකරණ සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදී එම උපකරණ සපයා සවිකළයුතු බවට දන්වා තිබුණත් එම උපකරණ සවි කිරීමකින් තොරව අදාළ ආයතනයට රු.504,878 ක් ගෙවීම් කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පුනරාවර්තන වැය විෂයන් 08 සඳහා වෙන් කර තිබුණ රු.77,734,000 කින් රු.59,333,309 ක් වැයකර තිබුණු බැවින් රු.18,400,691 ක් ඉතිරි වී තිබුණි. සමස්ථ ඉතිරිය තුළ වැඩසටහන් 33 ක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර අවස්ථා 04 කදී පමණක් වාර්තා නිකුත් කර තිබුණද එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | පාලන ගිණුම් නොසැසඳීම. |
| | | (ii) | වත්කම් ප්‍රාග්ධනගත නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ භෞතික සමීක්ෂණ සිදුකර නොතිබීම. |
| | | (ii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොගැනීම. |
| | | (iii) | ඉඩම් ගොඩනැගිලි හඳුනා ගැනීමේ පිරිවැය නිවැරදි නොවීම. |
| (ඇ) | ආදායම් | | හිඟ ආදායම් කාලීනව අය නොකිරීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | | ඉදි කිරීම් කටයුතු නියමිත කාලය තුළ සම්පූර්ණ නොකිරීම. |
| (ඉ) | ප්‍රසම්පාදන | | ප්‍රසම්පාදන කටයුතු අදාළ නීති, රීතිවලට අනුකූල නොවීම. |

.